SEDR
Supporting Effective Dispute Resolution
ඵලදායීව ආරවුල් නිරාකරණයට සහායවීම
பயனுறுதிமிக்கவகையில் பிணக்கை
தீர்ப்பதற்கு ஆதரவளித்தல்

# Supporting Effective Dispute Resolution

# Your document title

<u>ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය:</u>

*"සාධාරණ විකල්පයක් ශක්තිමත් කිරීම - SEDR වෙතින් පාඩම් සහ ගැඹුරු දැනුම"*

**1. <u>සැසිවාරයේ මාතෘකාව</u>**

*තේමාත්මක සැසිවාරය අංක. 6*

*සමථකරණ කටයුතුවලදී කාන්තා නියෝජනය: බාධක, විසඳුම් සහ පරම්පරා අතර දෘෂ්ටිකෝණ*

**2. <u>දිනය, වේලාව සහ ස්ථානය</u>**

2025 අප්‍රේල් 30 බදාදා
11:00 – 12:30
ස්ථානය: ඕක් කාමරය, සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය

**3. <u>සංකල්පයේ සාරාංශය / හැඳින්වීම</u>**

පොදු ක්ෂේත්‍රය තුළ කාන්තාවන් පෙනී සිටින ප්‍රමාණය ද ප්‍රජාව තුළ ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය ද වැඩිවී තිබෙන නමුත්, ශ්‍රී ලංකාවේ ජාතික සමථකරණ වැඩසටහන තුළ සමථකාරවරුන් ලෙස ඔවුන්ගේ සහභාගීත්වය අවම මට්ටමක පවතී. 1989 වසරෙහි සමථකරණ වැඩසටහන ප්‍රථම වරට ආරම්භ කරන අවස්ථාවේදී කාන්තා සමථකාරවරියන්ගේ සංඛ්‍යාව සියයට 1.4 ක් තරම් අඩු මට්ටමක පැවති අතර, දශක තුනකට පසුව මෙම සංඛ්‍යාව සියයට 30 කටත් වඩා අඩු අගයක් දක්වා වැඩි විය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආයතනික උනන්දුව වර්ධනය

Part of the programme
STRIDE — Strengthening Transformation, Reconciliation and Inclusive Democratic Engagement
Funded by the European Union
Implemented by
British Council
The Asia Foundation

වෙමින් පවතින අතර කාන්තා සමථකාරවරියන්ගේ වර්ධනය මන්දගාමී මට්ටමක තිබෙන නමුත් ඔවුන්ගේ සංඛ්‍යාවේ ස්ථාවර වැඩිවීමක් දක්නට ලැබුණද, සමථකරණ වැඩසටහන සඳහා වන ප්‍රතිපත්තිමය ප්‍රවේශය ස්ත්‍රී පුරුෂ සමාජභාවය මධ්‍යස්ථව පවතින අතර, මෙම තත්ත්වය ප්‍රජාව සඳහා සහ විශේෂ සමථ මණ්ඩලවලට සමථකාරවරුන් පත් කිරීමේ ක්‍රියාවලියේ නාමයෝජනාව ලබාදීමේ අවධියේදී බාධක ඇති වීමට දායක වේ.

කාන්තාවන් ස්වේච්ඡා භූමිකාවන් භාර ගැනීමට අකමැතිව සිටින බවට පවතින මතය සහ බොහෝ විට ඔවුන්ගේ ගෘහස්ථ වගකීම් පිළිබඳ දෘෂ්ටි කෝණයන්ට ඔවුන් බැඳී සිටීම වැනි කාරණාවන් නාමයෝජනා අවධියේදී ඔවුන්ව පසෙකට දමා ඇත. වැඩසටහන සහ නාමයෝජනා ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය අඩුකම, සුදුසුකම් සහ භූමිකාවන් පිළිබඳ පවා පවතින වැරදි වැටහීම් සහ වැරදි තොරතුරු, පිරිමි අයට පක්ෂපාතී වන ආකාරයෙන් ඔවුන්ව ඇතුළත් කිරීමට පවතින පිළිවෙත්, සමාජීය හා සංස්කෘතික ප්‍රතිමානවලට අදාළ අන්තර් ඡේදක අභියෝග සහ පොදු ජීවිතයට සහභාගී වීමට කාන්තාවන්ගෙන් ඇති උනන්දුවේ අඩුකම වැනි අනෙකුත් පවතින ගැටළු, සමථකරණ වැඩසටහනේ කාන්තා සමථකාරවරියන්ගේ සංඛ්‍යාව වැඩි කිරීමට බාධාවක් ලෙස ක්‍රියා කරනු ඇත. යථාර්ථයේ දී, බොහෝ කාන්තාවන් සමථකාරවරියන් ලෙස සේවය කිරීමට සහ යුක්තිය සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීමට සැලකිය යුතු ලෙස දායක වීමට උනන්දුවෙන් සිටිනු ඇත.

කාන්තා සමථකරණය යන මාතෘකාවට වැඩි පැහැදිලිතාවයක් ගෙන ඒම මඟින් සමථකරණයට කාන්තාවන්ගේ දායකත්වය සහ යුක්තිය සඳහා සමස්ත ප්‍රවේශය පිළිබඳ පවතින ඕනෑම වැරදි වැටහීමකට අභියෝග කළ හැකි අතර කාන්තාවන්ගේ සහභාගී වීමේ අයිතිය තහවුරු කිරීම සඳහා ක්‍රියාකාරී පියවර ගැනීමට පාර්ශවකරුවන්ට බලපෑම් කිරීමට ද හැකිය. මෙම සැසිවාරයේ අරමුණ වන්නේ, වැරදි වැටහීම් වලට සෘජුවම අභියෝග කරන අධ්‍යයන සොයාගැනීම් ඉස්මතු කිරීම සහ එම අධ්‍යයනයේ ප්‍රධාන නිර්දේශයක් ක්‍රියාත්මක කිරීමයි. මෙමඟින් ක්‍රියාකාරී ලෙස කටයුතු කරන සමථකාරවරියන්ගේ කථා බෙදා ගැනීමෙන්, සමථකාරවරියන් ලෙස ඉදිරියට පැමිණීමට අනෙකුත් කාන්තාවන් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය අවබෝධය ඇති කරනු ලබන අතර විභව අපේක්ෂකයින් පෙළඹවීමට, වැරදි වැටහීම් බිඳ දැමීමට ද සමථ මණ්ඩලවලට සම්බන්ධ වීමට කාන්තාවන් දිරිමත් කිරීමට ද ප්‍රබල මෙවලමක් ලෙස ලෙය ක්‍රියා කරයි. මෙවැනි අත්දැකීම් ඉස්මතු කරන නිර්දේශ කිරීමේ ක්‍රියා මාලාවන් මඟින් කාන්තාවන් ආදර්ශමත් චරිත ලෙස පෙන්වීමට ද ඔවුන් හට ලැබෙන ප්‍රජා පිළිගැනීම අවධාරණය කිරීමට ද විවිධාකාර පසුබිම්වල සිටින කාන්තාවන්ට සමථකරණය යනු ජීව්‍ය හා බලපෑම් සහිත භූමිකාවක් බවට පෙන්නුම් කිරීමට ද හැකිය.

## 4. <u>සැසිවාරයේ පරමාර්ථ</u>

- ශ්‍රී ලංකාවේ ජාතික සමථකරණ වැඩසටහනට සහ යුක්තිය සඳහා සමස්ත ප්‍රවේශයට කාන්තාවන්ගේ සහභාගීත්ව අයිතියේ වැදගත්කම සහ කාන්තාවන්ගේ දායකත්වය ඉස්මතු කිරීම.
- සමථකරණය සඳහා කාන්තා සහභාගීත්වය අඩු වන්නේ කෙසේද/අඩු වීමට හේතුව කුමක්ද යන කාරණාවන් ගැන සාකච්ඡා කිරීම.
- සමථකාරවරියන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම සඳහා නාමයෝජනා අදියරේදී කෝටා ක්‍රමයක් සඳහා අවස්ථාව ඉදිරිපත් කිරීම.
- සමථකාරවරියන් ලෙස ප්‍රජාවට සහභාගී වීමෙන් ඔවුන්ගේ අත්දැකීම් ප්‍රකාශ කිරීමට සහ ඔවුන්ගේ ගමන, ඔවුන්ට ලැබුණු සහයෝගය, ඔවුන් ලබා දුන් දායකත්වයන් සහ පුද්ගලික බලගැන්වීම ඇතුළු එම සමථකාරවරියන්ගේ සාර්ථකත්වයේ කතාවන් බෙදා ගැනීමට ඔවුන්ට අඩිතාලමක් සපයා දීම.

## 5. <u>මධ්‍යස්ථකරු / පහසුකම් සපයන්නා</u>

- මධ්‍යස්ථකරු: චන්දුල කුඹුකගේ මහත්මිය, වැඩසටහන් කළමනාකාරිනී, ආසියා පදනම.

## 6. <u>කථිකයන් / විශේෂඥ කණ්ඩායමේ සාමාජිකයන්</u>

- ඉදිරිපත් කරන්නිය: ආචාර්ය රමණි ජයසුන්දර, අධ්‍යක්ෂිකා: යුක්තිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ආසියා පදනම
- ඉදිරිපත් කරන්නිය: සුභෂනා විජයරත්න, වැඩසටහන් නිලධාරිනී මහත්මිය, ආසියා පදනම
- ඉදිරිපත් කරන්නිය: නිලක්ෂි ද සිල්වා මහත්මිය, උපදේශිකා, b-පොටෙන්ෂල්

- විශේෂඥ කණ්ඩායමේ සාමාජිකාවන්: x4 කාන්තා සමථකාරවරියන්